



# හැම විට සිහි වේ අම්මා

සොම්නස හෝ සන්තාපය හමුවේ
සිහි වේ සිහි වේ අම්මා
කරුණා ගුණයේ සාරය සොයලා
නිම කළ පිළිරුව අම්මා

ආදරයේ බල මහිමේ රතු ලේ සුදු වූවා
මැණියගේ සෙනෙහසිනී – රට ජාතිය හැදුවා
නිල්මිණි රන් කැට මේවා ඕනැ ද
ඕනැ නෑ ළඟ අම්මා
නොපෙනෙන දෙවියන් වැන්දේ ඇයි ඔබ
නිවසේ දෙවියන් අම්මා

පාවෙන සුළඟේ සිසිලස මවමින්
පෙන්වයි සාමය අම්මා
ජීවිතයේ පූජාවෙන් පිදුවත් මදි අම්මා
නිල්මිණි රන් කැට මේවා ඕනැ ද
ඕනැ නෑ ළඟ අම්මා
නොපෙනෙන දෙවියන් වැන්දේ ඇයි ඔබ
නිවසේ දෙවියන් අම්මා

පද මාලාව – **සරත් විමලවීර** ගායනය – **සුසිල් ප්‍රේමරත්න, ඉන්ද්‍රානි සේනාරත්න**

## අවබෝධය සහ රස විඳීම

1. මෙම ගීතය කණ්ඩායම් වශයෙන් සහ තනි තනි ව ගායනා කරන්න.

2. වටිනාකමින් ඉතා වැඩි වස්තූන් දෙකක් මෙම ගීතයෙහි සඳහන් වෙයි. ඒවා මොනවා ද?

3. ඔබ සිතන අන්දමට මවක තුළ තිබෙන යහපත් ගතිගුණ තෝරා කොටුව ඇතුළෙහි √ හෝ × ලකුණ යොදන්න.

   i. අම්මා ඉතා කරුණාවන්ත ය. ☐

   ii. අම්මා ඉතා සැරපරුෂ ය. ☐

   iii. මව දරුවන් සෑම දෙනාට ම සමාන ලෙස සලකයි. ☐

   iv. කළ යුතු නොකළ යුතු දේ ගැන දරුවන්ට උපදෙස් දෙයි. ☐

   v. දරුවෙකු වරදක් කළ විට නිවැරදි දේ කියා නොදෙයි. ☐

   vi. සාමය පලුදු වන පවුලේ ගැටුම්වලට ඉඩ නොදෙයි. ☐

4. i. මෙම ගීතයේ ඔබ වැඩියෙන් ප්‍රිය කරන ගී පද තෝරන්න.

   ii. අත්පොළසන් දෙමින් ඒවා තාලයට ගායනා කරන්න.

5. ස්ත්‍රී ලිංගික හෝ පුරුෂ ලිංගික නාම පද ලියමින් හිස් තැන් පුරවන්න.

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග |
|---|---|
| තාත්තා | .............. |
| මල්ලි | ................ |
| .................... | නැන්දා |
| සහෝදරයා | .................... |

6. මෙම යෙදුම්වලින් හැඟවෙන අදහස කියන්න.

i. කරුණා ගුණයේ සාරය සොයලා නිම කළ පිළිරුව අම්මා

ii. නිවසේ දෙවියන් අම්මා

iii. ජීවිතයේ පූජාවෙන් පිදුවත් මදි අම්මා

7. පහත සඳහන් වචන සඳහා ගීතයේ යෙදී ඇති වචන සොයා ලියන්න.

i. ගෙදර ..................    ii. සතුට ..................

iii. මැණික් ..................    iv. අවසන් කළ ..................

v. මතක් වෙයි ................    vi. ඉදිරියේ ..................

8. විරුද්ධ අර්ථය ගෙන දෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න

i. සොම්නස ..................    ii. සාමය ..................

iii. සිසිල ..................    iv. නිශ්චල ..................

v. ළඟ ..................    vi. නොපෙනෙන ................

(උණුසුම, යුද්ධය, දොම්නස, චංචල, දුර, පෙනෙන)

9. පහත දක්වෙන වාක්‍ය කීපය කියවන්න. කතාවේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.

ඒ සිකුරාද දවසකි. මම පාසලේ සිට වේලාසනින් ගෙදර ආවෙමි. හිස කකියන්නට විය. මම හිස බද ගෙන 'අම්මේ, මට සනීප නැහැ' කියමින් ඇඳට වැටුණෙමි. අම්මා ඉක්මනින් ඇඳ ළඟට ආවා ය. ..................................................................

......................................................................................................

10. අම්මා ගැන කවි කීපයක් ලියන්න.

## පැවරුම්

1. අම්මා ගැන කියැවෙන මෙම ජන කවිවල ඉතිරි පද සොයා ලියන්න. ඒවායින් හැඟවෙන අදහස් විමසා බලන්න.

(අ) **උඩින් යන්ට රන් තැටියක් ලැබියන්**

..................................................................

..................................................................

..................................................................

(ආ) **නෙත පුරා සුවසෙ නිදියන නිදි නැතුව**

..................................................................

..................................................................

..................................................................

2. විශාරද ගුණදාස කපුගේ ගායනා කරන පහත දක්වෙන ගී පද ඇසෙන විට ඔබේ සිත් තුළ මැවෙන චිත්‍රය අඳින්න.

**දවසක් පැල නැති හේනේ අකාල මහ වැසි වැස්සා**
**තුරුලේ හංගා ගෙන මා ඔබ තෙමුණා අම්මේ**

පද මාලාව – ***රන්බණ්ඩා සෙනෙවිරත්න***